# පුරාවිද්‍යාත්මක උරුමයන් ප්‍රවර්ධනයෙහිලා ජනමාධ්‍යයේ දායකත්වය

ඩබ්ලිව්.ඩී.එල්.එච්. විතානගේ[1]

පුරාවිද්‍යාත්මක උරුමය ප්‍රවර්ධනයට ජනමාධ්‍යයේ දායකත්වය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. මෙහිදී ජනමාධ්‍යයේ එක් ප්‍රභේදයක් වන මුද්‍රිත මාධ්‍ය ප්‍රමුඛ කරගනිමින් දත්ත රැස්කිරීම සිදු කරන ලදී. මුද්‍රිත මාධ්‍ය අතුරිනුත් ලංකාවේ වැඩිම අලෙවියක් සිදුවන ඉරිදා ලංකාදීප පුවත්පතෙහි හැසිරීම පමණක් අධ්‍යයනයට හසුකර ගෙන ඇත.මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වන්නේ, පුරාවිද්‍යාත්මක උරුමයන් ප්‍රවර්ධනයට ජනමාධ්‍ය අතුරින් මුද්‍රිත මාධ්‍යක් වන ඉරිදා ලංකාදීප පුවත්පත ක්‍රියාකළ ආකාරය කෙබඳු ද? යන්නයි. ඒ අනුව 2019 සැප්තැම්බර් 15 දින සිට මාර්තු 15 දින දක්වා ඉරිදා ලංකාදීප පුවත්පත තුළ පළ වූ විශේෂාංග පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ප්‍රධාන පර්යේෂණ ක්‍රම ද්විත්වයම භාවිත කරමින් අධ්‍යයනය සිදුකොට ඇත. එහිදී ඉරිදා ලංකාදීප පුවත්පත තුළ පුරාවිද්‍යාත්මක උරුමයන් ප්‍රවර්ධනය හා සම්බන්ධව පළකළ ලිපි මොනවාද යන්න, ඉහත සඳහන් කළ කාල වකවානුව තුළ පුවත්පත තුළ පළකිරීමට යෙදුණු ලිපි ප්‍රමාණය හා පුවත්පත තුළ ඒ සඳහා ලබා දී ඇති ඉඩ ප්‍රමාණය අධ්‍යයනය කර ඇත. එහිදී ඉරිදා ලංකාදීප පුවත්පත තුළ විශේෂාංගයන් වන රසවිත, තක්සලාව, නිම්තෙර විශේෂාංගයන්ට අමතරව පුවත්පත තුළ ප්‍රධාන ලිපි ලෙස ද මෙකී උරුමයන් ප්‍රවර්ධනය කර ඇත. පුවත්පත තුළ පළමු වැනි, තෙ වැනි, සය වැනි පිටුවල මෙම ලිපි පළ කිරීම තුළින් පාඨක අවධානය මෙම ලිපි කෙරේ වැඩි වශයෙන් රඳවා ගැනීමට කටයුතු කර ඇත. මෙම අධ්‍යනයේ දී විශද වූ කරුණ නම් වර්තමානයේ පුරාවිද්‍යාත්මක උරුමයන් සම්බන්ධව පොදු ජනයා හට පවත්නා අවබෝධයෙහි අඩුලුහුඩුකම් හේතුකර ගෙන මෙකී උරුමයන් විනාශවෙමින් පවත්නා බවත් සමාජය තුළ ප්‍රබල බලපෑමක් සිදුකළ හැකි මුද්‍රිත මාධ්‍යක් වන පුවත්පත් මාධ්‍ය මෙකී උරුමයන් ප්‍රවර්ධනය තුළින් යම් අවබෝධයක් පාඨක ජනයා වෙත ලබාදිය හැකි බවයි. සමස්ත ලිපි ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස ඓතිහාසික තොරතුරු ඇතුළත් ලිපි 56%ක්, පුරාවිද්‍යාත්මක ස්ථානයන් පිළිබඳව සඳහන් ලිපි 28% ක් හා පුරාවිද්‍යාත්මක උරුමයන් සඳහා සිදු වූ හානි පිළිබඳව සඳහන් ලිපි 9%ක් පළ කර තිබුණි. එමෙන්ම සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය ද අරමුණු කරගනිමින් පුරාවිද්‍යාත්මක උරුමයන් පිළිබඳ ලිපි 6% ක් පළකිරීමට කටයුතු කර ඇත. එහිදී පුරාවිද්‍යාත්මක උරුමයන් ප්‍රවර්ධනයට මුද්‍රිත මාධ්‍යක් වන ඉරිදා ලංකාදීප පුවත්පත අවධානය යොමු කර ඇති බවට නිගමනය විය. ඉහත සඳහන් කළ අධ්‍යයන කාල සීමාවට අනුව මෙම කරුණු පිළිබඳව වැඩිදුර විග්‍රහ කිරීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පද :** පුරාවිද්‍යාව, උරුමය, ප්‍රවර්ධනය, ලංකාදීප, සන්නිවේදනය

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. lilaniharshani995@gmail.com